සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 12 | විෂයය / பாடம் / Subject } ඉන්දීය ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper } II | පැය / மணித்தியாலம் / Hours } |

උපදෙස්

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයකවත් තෝරා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දීය දළ සිතියමක් 1කොටස සමඟ සපයා ඇත.

## A කොටස

1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i. මක්‍රාන් ii. ලෝතාල් iii. හරප්පා iv. මොහෙන්ජොදාරෝ
v. රාවී නදිය vi. කාවේරි නදිය vii. වින්ධ්‍යා කඳු viii. පාඨලීපුත්‍ර
ix. අලහබාද් x. තාම්‍රලිප්ති xi. උදේනි xii. ජුනාගද්

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

## B කොටස

2) ''ඉන්දුනිම්න ශිෂ්ටාචාරය බිඳවැටීම ආක්‍රමණයක ප්‍රතිඵලයකි.''

i. ඉන්දුනිම්නයේ සභ්‍යත්වයට අයත් ප්‍රධාන නගර 02 ලියන්න. (ලකුණු 01 යි)
ii. මෙහි කැණීම් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02 යි)
iii. ඉන්දුනිම්නයේ ප්‍රභවය පිළිබඳ ඇති මත දෙක නම් කරන්න. (ලකුණු 03 යි)
iv. ඉහත කියමන විචාරාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

3) ''උතුරේ කඳුවැටි වැදගත් වූයේ ආරක්ෂාව නිසාම පමණක් නොව, ප්‍රධානතම ගංගා දෙකටම මූලය සැපයූ බැවිනි.'' මෙම කියමන විචාරාත්මකම විමසන්න. (ලකුණු 16 යි)

4) පශ්චාත් වෛදික යුගය යනු පරිවර්තනීය අවධියකි.

i. ඍග් වෛදික යුගය පිළිබඳ තොරතුරු ලබාගත හැකි ප්‍රධානතම මූලාශ්‍රය කුමක්ද (ලකුණු 01 යි)

ii. ආර්ය ජනාවාස පිහිටුවීමේදී වැදගත් වූ ගංගා දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

iii. ඍග් වෛදික යුගයේ සමාජ, ආර්ථික, ආගමික, දේශපාලනික කරුණු පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වූ ආකාරය සැලකිල්ලට ගෙන ඉහත කියමනට ඔබ කොතෙක් දුරට එකඟ වේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 13 යි)

5) පහත මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය

ii. ඉන්දුනිම්නයේ ආගමික විශ්වාස

iii. මෙගෙස්තනීස්

iv. වයඹ දිග කපොලු (ලකුණු 8x2=16 යි)

## C කොටස

6) ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන හා ආගමික යන අංශවල ඇතිවූ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 16 යි)

7) මගධ රාජ්‍යය සෙසු ජනපද අභිබවා ඉදිරියට පැමිණීමට බලපෑ හේතු පහත ශීර්ෂ ඔස්සේ පහදන්න.

i. භූගෝලීය /ආර්ථික සාධක

ii. රජවරුන් අනුගමනය කළ උපක්‍රම (ලකුණු 8x2=16 යි)

8) I චන්ද්‍රගුප්ත රජු ඉන්දියාවේ බිහිවූ පළමු අධිරාජ්‍යයා විය.

i. මෞර්ය යුගයේ අධ්‍යයනයට ඇති ග්‍රීක මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)

ii. චන්ද්‍රගුප්ත මෞර්යගේ උපත පිළිබඳ ඇති මත කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

iii. චන්ද්‍රගුප්ත මෞර්යගේ කාර්යයන් ඇසුරින් ඉහත කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

9) පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. නන්ද රජ වංශය

ii. වර්ණ ආශ්‍රම ධර්ම

iii. ක්‍රි.පූ. 6 සියවසේ සන රාජ්‍ය

iv. සංගම් සාහිත්‍ය (ලකුණු 8x2=16 යි)